# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,086 - 2018 අගෝස්තු මස 24 වැනි සිකුරාදා - 2018.08.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු ... ... ... | 1266 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1272 |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1277 |


සැ. යු. - ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත 2018 අගෝස්තු මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 සැප්තම්බර් 14 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 අගෝස්තු 31 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1265 - B 81443— 5,403 (2018/08)

# තනතුරු - ඇබෑර්තු

## නාරම්මල ප්‍රාදේශීය සභාව

ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය හා ශිල්පීය තනතුරු සඳහා බඳවා ගැනීම

නාරම්මල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවාගැනීම සඳහා මෙම උපලේඛනයේ සඳහන් සුදුසුකම් ඇති නාරම්මල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| 1. වැඩ ක්ෂේත්‍ර කම්කරු | 03 | 03/2016 දරන රා.ප.ච. PL-1-2016 වැටුප් කේතය රු. 24,250 - 10 x 250 -10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාග යේ දී යටත් පිරිසෙයින් විෂයන් දෙකක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) |
| 2. මුරකරු | 02 | 03/2016 දරන රා.ප.ච. PL-1-2016 වැටුප් කේතය රු. 24,250 - 10 x 250 -10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍යපෙළ විභාග යේ දී යටත් පිරිසෙයින් විෂයන් දෙකක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) |
| 3. රියදුරු | 01 | 03/2016 දරන රා.ප.ච. PL-3-2016 වැටුප් කේතය රු. 25,790 - 10 x 270 -10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 | (අ) *බාහිර අයදුම්කරුවන් :*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයන් දෙකක් (02) ට සම්මාන සහිතව විෂයන් හයක් (06) වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) අවම වශයෙන් එක් වතාවකදී විෂයන් පහක් (05)ක් සමත් විය යුතුය.<br>(අ) I. *අභ්‍යන්තර අයදුම්කරුවන් :*<br>දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 08 ශ්‍රේණිය (09 වසර) සමත් විය යුතුය.<br>*වෙනත් සුදුසුකම් :*<br>තාර බර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ටේලර්, මගීන් 32ට වඩා ගෙන යාමට හැකි බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. ( A පන්තියේ රියදුරු බලපත්‍රයක්) වාහන රියදුරු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය. (සේවා සහතික මගින් සනාථ කළ යුතු වේ.) |

02. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

I. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

II. අයදුම්කරුවන් නාරම්මල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුයි. (වසර 03ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතුයි).

III. අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18 නොඅඩු සහ අවු. 45ට නොවැඩි විය යුතුයි.

IV. නාරම්මල ප්‍රාදේශීය සභාවේ දැනට තාවකාලික අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

V. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍යයකින් සිටිය යුතු අතර, දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුයි.

VI. දැනටමත් පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම් ඔහු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර , එකී පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුයි.

VII. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ.

03. *සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි :*

I. මෙම තනතුු ස්ථිරය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණය අනුව තීරණය කරනු ලැබේ.

II. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු දයකත්වය හිමි වේ.

III. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

04. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලටද වයඹ පළාත් සභාව හෝ වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝගවලටද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකින් බැඳී සිටිය යුතුයි.

05. *අයදුම්පත් සමග ඉදිරිපත් කළ යුතු ලේඛන :*

අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීකෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

I. උප්පැන්න සහතිකය;

II. අධ්‍යාපන සහතික;

III. තම පදිංචිය සනාථ කිරීම (ග්‍රාම සේවා නිලධාරිගෙන් ලබා ගත් සහතිකය ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සහතික කර තිබිය යුතුය.) ;

IV. මෑතකදී ලබා ගත් චරිත සහතික 02ක් (එක් සහතිකයක් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගෙන් ලබා ගත යුතුයි.) ;

V. වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික;
(රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ නියුක්ත වූවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.).

මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

*අයදුම් කළයුතු අකාරය :*

අයදුම්රුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් ඉල්ලුම් කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා 2018.09.14 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, නාරම්මල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ව බලය නාරම්මල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

බී. ඒ. මෙත්තානන්ද,
ලේකම්,
නාරම්මල ප්‍රාදේශීය සභාව,
නාරම්මල.

2018ක් වූ අගෝස්තු මස 08 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*නාරම්මල ප්‍රදේශීය සභාවේ පුරප්පාඩුව පවතින ප්‍රාථමික ශිල්පීය/ශිල්පීය නොවන/අර්ධ ශිල්පීය ශ්‍රේණියේ ............................................................ තනතුර සඳහා බඳවා ගැනීම*

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————————————.
2. මුලකුරු සමග නම :——————————————.
3. ස්ථිර ලිපිනය :——————————————.
4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————————.
5. උපන් දිනය : වර්ෂය :——————. මාසය :——————. දිනය :——————.
6. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු :——————. මාස :——————. දින :——————.
7. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————.
8. විවාහක/අවිවාහක බව :——————————————.
9. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————.
10. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන්ද ලියාපදිංචි වීමෙන්ද යන වග :——————————————.
11. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල ඡායාපිටපත් අමුණා එවන්න.)

අ.පො.ස./සා. පෙළ විභාගය : සමත් වර්ෂය : ....................................... විභාග අංකය : .......................................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ. පො. ස. උ/පෙළ විභාගය සමත් වර්ෂය : ....................................... විභාග අංකය : .......................................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

12. 1. වෙනත් අධ්‍යාපන සුදුසුකම් :——————————————.
2. වෘත්තීය සුදුසුකම් :——————————————.
3. සේවා පළපුරුද්ද :
   I. දැනට සේවය කරන ආයතනය :——————————————.
   II. දැනට දරන තනතුර :——————————————.
   III. එම තනතුරට පත් වූ දිනය :——————————————.
   IV. මීට පෙර සේවය කරන ලද ස්ථාන හා දරන ලද තනතුර :——————————————.

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා දරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බවට ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

____________________.

අයදුම්කරුගේ අත්සන.

දිනය :____________________

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

.............................................................මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ ............................................................ වශයෙන් සේවයේ නියුක්තව සිටියි. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක./නොහැක. ඔහු/ඇය පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර කිසිදු දඬුවමකට භාජනය වී නොමැති බව සහතික කරන අතර, ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි.

................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :____________________

08-906

---

**කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරුවලට සුදුසුකම් ඇති කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්* | *වැටුප් පරිමාණය* | *බඳවා ගැනීම* |
|---|---|---|---|---|---|
| 01 | මුරකරු III ශ්‍රේණිය | 01 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයන් 02කට සම්මාන සහිතව විෂයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයන් 05ක් එක්වරක දී සමත් වී තිබිය යුතුයි. | PL-1-2016 රු. 24,250 - 10 x 250 -10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය |

01. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

(i) ශ්‍රී ලාංකිකයෙකු විය යුතුයි.

(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුයි. දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(iii) කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යටත් පිරිසෙයින් අවුරුදු 03ක ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතුයි. (ඡන්ද හිමි නාමලේඛනය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මගින් එය සනාථ කළ යුතුයි.)

(iv) කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(v) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුයි.

(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුයි.

(vii) රජයේ හෝ පළාත් පාලන සේවයේ පහ කරනු නොලැබූ අයෙකු විය යුතුයි.

(viii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවකු නොවිය යුතුයි.

(ix) දැනට කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත්/ස්වේච්ඡා/ස්ථිර පදනම මත සේවයේ යෙදෙන සේවකයන් සම්බන්ධයෙන් විශේෂයෙන් සලකා බලනු ලැබේ.

(x) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාල සීමාවේ දී, මධ්‍යම පළාතේ මෙම තනතුරුවලට අදාළව නව බඳවා ගැනීම් පරිපාටි ව්‍යවස්ථා සංශෝධනය වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, බඳවා ගැනීම් ප්‍රමාද කිරීම, වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

02. *සේවා නියුක්ති කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ. ස්ථිර සේවකයින් අවුරුදු 01 ක පරිවාස කාලයකට යටත් වේ.

(ii) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුයි.

(iii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුයි

(iv) මෙම බඳවා ගනීම් කොන්දේසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද/රජයේ මුදල් රෙගුලාසිවලට ද/ රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද /මධ්‍යම පළාත් සභාව හෝ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුයි.

03. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර පහත සඳහන් ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා එවිය යුතුයි :

(i) උප්පැන්න සහතිකය

(ii) අධ්‍යාපන සහතික

(iii) ජාතික හැඳුනුම්පත් ඡායා පිටපතක්

(iv) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය

(v) මෑතක දී ලබාගත් චරිත සහතික 02 ක් (මින් 01 ක් ග්‍රාම නිලධාරිගෙන් ලබා ගත යුතුය.)

(vi) පළපුරුද්ද පිළිබඳ සහතිකය

(vii) වෙනත් සුදුසුකම් පිළිබඳ සහතිකය

04. වෘත්තීය තොරතුරු සමග සම්පූර්ණ ජීව දත්ත ඇතුළත් පහත සඳහන් පරිදි සකසා ගත් අයදුම්පතක් අදාළ සියලුම සහතිකවල පිටපත් ද සමගින් 2018.09.18 දින හෝ එදිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුයි.

05. අයදුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුරෙහි නම සඳහන් කළ යුතුය.

06. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙහි නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව එවිය යුතුය.

07. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

එස්. ආර්. අතාවුද,
ලේකම්,
කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව,
මැණික්හින්න.

2018 අගෝස්තු

**කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ .............................. තනතුර සඳහා අයදුම් පත්‍රය**

1. මුලකුරු සමග නම :—————————————.

   මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————————————.

2. ස්ථිර ලිපිනය :—————————————.

3. උපන් දිනය : අවුරුද්ද:————— මාසය:————— දිනය:—————

4. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

5. ස්ත්‍රී/පුරුෂ භාවය :—————————————.

6. දුරකථන අංකය : | | | | | | | | | | |

7. විවාහක/අවිවාහක බව :—————————————.

8. අධ්‍යාපන සුදුසුකම් :—————————————.

   8.1 අයදුම්කරුවන් අවසන් වරට සමත් වූ පන්තිය සිංහල :......................................

   දෙමළ :......................................

   8.2 අ.පො.ස. (සා.පෙළ) විභාගය

   (i) වර්ෂය :...................................... මාසය :......................................

   (ii) විභාග අංකය :......................................

   (iii) ප්‍රතිඵල :......................................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

   8.3 අ.පො.ස. (උ.පෙළ) විභාගය

   (i) වර්ෂය :...................................... මාසය :......................................

   (ii) විභාග අංකය :......................................

   (iii) ප්‍රතිඵල :......................................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

09. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :—————————————.

10. වෙනත් සුදුසුකම් :—————————————.

11. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද? :—————————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බව ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම් ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමටද යටත් වන බවද මම දනිමි.

.................................

අයදුම්කරුගේ අත්සන.

දිනය:————————

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

(රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/ රජයේ සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි) මෙම ආයතනයේ ...........................................තනතුර දරන............................මයා/මෙනවියගේ අයදුම්පත නිර්දේශකර ඉදිරිපත් කරමි. ඔහුගේ /ඇයගේ වැඩ හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට යෙදෙන සේවයෙන් නිදහස් කළ හැකි බවත්/නොහැකි බවත් සහතික කරමි.

.................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————————

08-985

---

## පළාත් පාලන නිවේදන

### කඩුවෙල මහා නගර සභාව

1989 අංක 12 පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 වන අධිකාරිය වූ මහා නගර සභා ආඥාපනතේ 71 (1) වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති පාර ''සමාධි මාවත'' යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

සංජීව බන්දුකීර්ති,
නාගරික කොමසාරිස්,
කඩුවෙල මහා නගර සභාව.

2018 අගෝස්තු මස 07 වැනි දින
කඩුවෙල මහා නගර සභාවේ දී ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 01 | පළාත් පාලන ආයතනයේ නම | :- | කඩුවෙල මහා නගර සභාව |
| 02 | දිස්ත්‍රික්කය | :- | කොළඹ |
| 03 | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | :- | 490 අතුරුගිරිය |
| 04 | වීථියේ වර්තමාන නම | :- | නැත |
| 05 | අලුතින් යොදා ඇති නම | :- | සමාධි මාවත |
| 06 | මාර්ග විස්තර | : | |

(i) මාර්ගයේ ආරම්භය :

| | | |
|---|---|---|
| වම්පස | :- | අතුරුගිරිය ගොඩගම පාරේ නිවාස අංක 261/9 දරන දේපල |
| දකුණුපස | :- | අතුරුගිරිය ගොඩගම පාරේ නිවාස අංක 261/6 දරන දේපල |

(ii) මාර්ගයේ අවසානය

| | | |
|---|---|---|
| වම්පස | :- | නම් කිරීමට යෝජිත මාර්ගයේ නිවාස අංක 261/4 දරන දේපල |
| දකුණුපස | :- | නම් කිරීමට යෝජිත මාර්ගයේ නිවාස අංක 261/3 දරන දේපල |
| | | මාර්ග අවසානය නිවාස අංක 261/5 දරන දේපල |

08 -774/1

## කඩුවෙල මහා නගර සභාව

1989 අංක 12 පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 වන අධිකාරිය වූ මහා නගර සභා ආඥාපනතේ 71 (1) වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් පහත දැක්වෙන උප ලේඛනයේ විස්තර කර ඇති පාර ''ට්‍රැන්කුයිල් ටෙරස්'' යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

සංජීව බන්දුකීර්ති,
නාගරික කොමසාරිස්,
කඩුවෙල මහා නගර සභාව.

2018 අගෝස්තු මස 07 වැනි දින,
කඩුවෙල මහා නගර සභාවේදී ය.

### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 01 | පළාත් පාලන ආයතනයේ නම | :- | කඩුවෙල මහා නගර සභාව |
| 02 | දිස්ත්‍රික්කය | :- | කොළඹ |
| 03 | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | :- | 473 කොතලාවල |
| 04 | වීථියේ වර්තමාන නම | :- | නැත |
| 05 | අලුතින් යොදා ඇති නම | :- | ට්‍රැන්කුයිල් ටෙරස් |
| 06 | මාර්ග විස්තර | :- | |

(i) මාර්ගයේ ආරම්භය :

| | | |
|---|---|---|
| වම්පස | :- | කඩුවෙල කොල්ලුපිටිය 177 බස් මාර්ගයේ අංක 168/1/ඊ දරන හිස් ඉඩම |
| දකුණුපස | :- | කඩුවෙල කොල්ලුපිටිය 177 බස් මාර්ගයේ නිවාස අංක 42/3 දරන දේපල |

(ii) මාර්ගයේ අවසානය :

| | | |
|---|---|---|
| වම්පස | :- | නම් කිරීමට යෝජිත මාර්ගයේ අංක 168/1/ඩී දරන හිස් ඉඩම |
| දකුණුපස | :- | නම් කිරීමට යෝජිත මාර්ගයේ පිහිටි හිස් ඉඩම |

08 -774/2

---

## කඩුවෙල මහා නගර සභාව

1989 අංක 12 පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 වන අධිකාරිය වූ මහා නගර සභා ආඥාපනතේ 71 (1) වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති පාර ''සුහද මාවත'' යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

සංජීව බන්දුකීර්ති,
නාගරික කොමසාරිස්,
කඩුවෙල මහා නගර සභාව.

2018 අගෝස්තු මස 07 වැනි දින,
කඩුවෙල මහා නගර සභාවේදී ය.

### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 01 | පළාත් පාලන ආයතනයේ නම | :- | කඩුවෙල මහා නගර සභාව |
| 02 | දිස්ත්‍රික්කය | :- | කොළඹ |
| 03 | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | :- | 472/B පහළ බෝමිරිය |
| 04 | වීථියේ වර්තමාන නම | :- | නැත |
| 05 | අලුතින් යොදා ඇති නම | :- | සුහද මාවත |

06 මාර්ග විස්තර :-

(i) මාර්ගයේ ආරම්භය :

වම්පස :- කඩුවෙල පහළ බෝමිරිය මේධානන්ද මාවතේ නිවාස අංක 212/සී/4 දරන දේපල
දකුණුපස :- කඩුවෙල පහළ බෝමිරිය මේධානන්ද මාවතේ නිවාස අංක 212/2/බී දරන දේපල

(ii) මාර්ගයේ අවසානය :

දකුණු පස :- නම් කිරීමට යෝජිත මාර්ගයේ අංක 213/2 දරන හිස් ඉඩම
මාර්ග අවසානය :- නම් කිරීමට යෝජිත මාර්ගයේ නිවාස අංක 213/2/ඒ දරන දේපල

08 -774/3

---

**කඩුවෙල මහා නගර සභාව**

1989 අංක 12 පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 වන අධිකාරිය වූ මහා නගර සභා ආඥාපනතේ 71 (1) වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති පාර ''ස්වර්ණ පෙදෙස'' යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

සංජීව බන්දුකීර්ති,
නාගරික කොමසාරිස්,
කඩුවෙල මහා නගර සභාව.

2018 අගෝස්තු මස 07 වැනි දින,
කඩුවෙල මහා නගර සභාවේදී ය.

උපලේඛනය

01 පළාත් පාලන ආයතනයේ නම :- කඩුවෙල මහා නගර සභාව
02 දිස්ත්‍රික්කය :- කොළඹ
03 ග්‍රාම නිලධාරී කොට්ඨාසය :- 488 කොරතොට
04 වීථියේ වර්තමාන නම :- නැත
05 අලුතින් යොදා ඇති නම :- ස්වර්ණ පෙදෙස
06 මාර්ග විස්තර
:-

(i) මාර්ගයේ ආරම්භය

වම්පස :- කොරතොට රාජසිංහ මාවතේ නිවාස අංක 148/1/බී දරන දේපල
දකුණුපස :- කොරතොට රාජසිංහ මාවතේ නිවාස අංක 148/1 දරන දේපල

(ii) මාර්ගයේ අවසානය

වම්පස :- නම් කිරීමට යෝජිත මාර්ගයේ නිවාස අංක 148/7/ඒ දරන දේපල
දකුණුපස :- නම් කිරීමට යෝජිත මාර්ගයේ නිවාස අංක 148/3/ඒ දරන දේපල

08 -774/4

**කඩුවෙල මහා නගර සභාව**

1989 අංක 12 පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තය සමග කියවිය යුතු 252 වන අධිකාරිය වූ මහා නගර සභා ආඥාපනතේ 71 (1) වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති පාර ''පාතිමා දේවස්ථාන පාර'' යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

සංජීව බන්දුකීර්ති,
නාගරික කොමසාරිස්,
කඩුවෙල මහා නගර සභාව.

2018 අගෝස්තු මස 07 වැනි දින
කඩුවෙල මහා නගර සභාවේදී ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 01 | පළාත් පාලන ආයතනයේ නම | :- | කඩුවෙල මහා නගර සභාව |
| 02 | දිස්ත්‍රික්කය | :- | කොළඹ |
| 03 | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | :- | තලංගම උතුර A |
| 04 | වීථියේ වර්තමාන නම | :- | නැත |
| 05 | අලුතින් යොදා ඇති නම | :- | පාතිමා දේවස්ථාන පාර |
| 06 | මාර්ග විස්තර | :- | |
| | (i) මාර්ගයේ ආරම්භය | | |
| | වම්පස | :- | කඩුවෙල බත්තරමුල්ල මාර්ගයේ Lodestar International school |
| | දකුණුපස | :- | පෞද්ගලික ආයතන ගොඩනැගිල්ල |
| | (ii) මාර්ගයේ අවසානය | | |
| | වම්පස | :- | නම් කිරීමට යෝජිත මාර්ගයේ පිහිටි හිස් ඉඩම |
| | දකුණුපස | :- | නම් කිරීමට යෝජිත මාර්ගයේ නිවාස අංක 11/ඒ දරන දේපල |

08 -774/5

---

**මාතර මහා නගර සභාව**

2018 පරිපූරක ඇස්තමේන්තු ලේඛනය

2018 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද ආදායම් හා වියදම් ඇතුළත් කරන ලද පරිපූරක ඇස්තමේන්තු ලේඛනය මාතර මහා නගර සභා කාර්යාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව සඳහා 2018.08.24 දින සිට දින හතක (07) කාලයක් විවෘතව තබන බව මහා නගර සභා ආඥාපනතේ 214 (2)(ආ) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ජී. රංජිත් යසරත්න,
නගරාධිපති,
මහා නගර සභාව,
මාතර.

2018 අගෝස්තු මස 24 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

08-831

**කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව විසින් මෙකී පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් විසින් හෝ යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට දන්වන අතර, ඉදිරියේ දී මෙම මාර්ග වලට අයත් ඉඩම්වලින් අදාළ බිම් ප්‍රමාණය අත්පත් කර ගැනීමට කටයුතු යොදන බවද මෙයින් දනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

සභාපති,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

**මාර්ග ලියාපදිංචි කිරීම**

| *පාරේ නම* | *ග්‍රාම නිලධාරි වසම* | *දෙපස ඇති ඉඩම* | | *ආරම්භය* | *අවසානය* | *දුර* | *පළල* |
|---|---|---|---|---|---|---|---|
| | | *වම* | *දකුණ* | | | *මීටර්* | *අඩි* |
| 01. මිල්ලගහවත්ත පාර | ගතාර නැගෙනහිර | හිරිදෙනිය පහල කැල්ල 1 | හිරිදෙනිය පහල කැල්ල 1 මිල්ල ගහවත්ත C කොටස | කඹුරුපිටිය මුලටියන ප්‍රධාන මාර්ගයේ ආදපාන මූලික රෝහල ඉදිරිපිට | මිල්ල ගහවත්ත ඉඩම | මීටර් 60 | 12 |
| 02. මාස්මුල්ල ඕවිටිගමුව මාර්ගය | 321/බී, උල්ලල මාස්මුල්ල | පානදුරේ ගෙදරහේන ඉඩම | කිතලගහහේන ඉඩම | පානදූරේගෙදර හේන 321/බී උල්ලල ඕවිටිගමුව | ලක්මාලි ගොඩැල්ලහේන ඕවිටිගමුව දකුණ කරපුටුගල | මීටර් 100 | 10 |

08-780

# විවිධ දැන්වීම්

## 2018 වර්ෂය සඳහා LED ප්‍රචාරක පුවරු සඳහා ගාස්තු පැනවීම

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ 1989.01.20 දිනැති අංක 541/17 දරන *ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශිත සම්මත අතුරු ව්‍යවස්ථාවේ 2004.02.10 වැනි දින හා 2008.09.09 වැනි දිනයන්හි පැවති මහා සභාව විසින් වැළඳගෙන ඇති අතර, ඒ අනුව එහි සඳහන් II කොටසේ සඳහන් වන ප්‍රචාරක දැන්වීම් පිළිබඳව ඇති අතුරු ව්‍යවස්ථාව අනුව LED ප්‍රචාරක පුවරු සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේදී පහත උපලේඛනයේ සඳහන් මිළ ප්‍රමාණයන් 2018 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් 2018 අගෝස්තු 30 දිනට පෙර සභාවෙන් මෙම බලපත්‍ර ලබාගත යුතු බවත් 2018.06.07 දින පැවති මහා සභාව විසින් තීරණ අංක 07:01 (2018/මා.මනස/මුදල් ප්‍ර/16) යටතේ ඒකමතිකව සහා සම්මත කළ බව දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

1. මාතර ශ්‍රී රතනපාල මාවත හා අකුරැස්ස පාරට මුහුණලා සවි කරන ලද පුවරු වලින් වර්ග අඩියකට රු. 1,000 ක් බැගින් අය කිරීමටත්,
2. මාතර අනගාරික ධර්මපාල මාවතට මුහුණලා සවි කරන ලද පුවරු වලින් වර්ග අඩියකට රු. 1,250 බැගින් අය කිරීමටත්,
3. මාතර මහා නගර සභා භූමියේ සවි කරන ලද පුවරුවලින් වර්ග අඩියකට රු. 2,000 ක මුදලක් ද අය කරනු ලැබේ.

ඩී. ජී. යසරත්න,
නගරාධිපති,
මාතර මහා නගර සභාව.

2018 අගෝස්තු මස 03 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

08-728

---

## නෙළුව ප්‍රාදේශීය සභාව

### කසළ ශෝධන ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සහ 126 IX (ආ) වගන්තිය ප්‍රකාරව ලැබී ඇති බලතල මත නෙළුව ප්‍රාදේශීය සභාව විසින් 2005.10.18 දින සම්මත කරගත් 1988.08.23 දින 520/07 පොදු අතුරු ව්‍යවස්ථාවේ (04) අනුව කසළ ශෝධන සේවා මගින් සේවය සලසනු ලබන යම් ස්ථානයක පදිංචිකරුවෙකු/ව්‍යාපාරිකයෙකු වෙනුවෙන් පහත සඳහන් පරිදි කසල ශෝධන සේවා ගාස්තුවක් 2018 ජූලි මාසයේ සිට මාස්පතා අය කිරීමට 2018 මැයි මස 15 වැනි දින මහා සභාවේදී යෝජනා කරන්නීය. එය ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. අයි. ජී. සුනිල්,
සභාපති,
නෙළුව ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 02 වැනි දින,
නෙළුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| | | | රු. | | රු. |
|---|---|---|---|---|---|
| (i) | එළවළු වෙළඳසැලක් සඳහා | - | 1,000 | - | 1,500 |
| (ii) | පළතුරු වෙළඳසැලක් සඳහා | - | 800 | - | 1,000 |
| (iii) | හෝටලයක් සඳහා | - | 1,000 | - | 1,500 |
| (iv) | වෙනත් වෙළඳ ස්ථාන සඳහා | - | 200 | - | 800 |

08-905

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.